# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1364/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 23/08/2024 පැය 0855

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් 02ක් සහ තවත් සැකකරුවන් 36 දෙනෙකු අත්අඩංගුවට - කළුතර, ගාල්ල, මාතර, කොළඹ, බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ කොළඹ අපරාධ කොට්ඨාසය හා මාතර අපරාධ කොට්ඨාසය විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

1. 2024.08.22 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 41 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

2. 2024.08.22 වන දින බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් හංවැල්ල පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 50 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කුරුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සමාජිකයින් දෙදෙනාට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධ වලට සහය දැක්වූ බවට සැක කරන තවත්

සැකකරුවන් 36 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.08.22 වන දින සැකකරුවන් 38 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.08.22 වන දින දක්වා සමස්ත සැකකරුවන් හා සැකකාරියන් 3411 ක් අත්අඩංගුවට** ගෙන ඇති අතර, සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා සෘජුවම සහය දැක්වීම්, අපරාධ සැලසුම් කිරීම හා එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, මාතර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**